# සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය

## දැක්ම

“ශ්‍රී ලංකාව දකුණු ආසියානු කලාපයේ වඩාත් මිත්‍රශීලී සහ තරගකාරී ගුවන් කේන්ද්‍රස්ථානය ලෙස වැඩි දියුණු කිරීම”

## මෙහෙවර

“ගුවන්සේවා ක්ෂේත්‍රය තුළ දේශීය සහ ජාත්‍යන්තර අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස තරගකාරීත්වයට මුහුණ දිය හැකි ගුණාත්මක ගුවන්සේවාවන් සැලසීමට ඉවහල් වන වඩාත් යෝග්‍ය ප්‍රතිපත්ති රටාවක් පිළියෙල කිරීම හා කාර්යක්ෂම යාන්ත්‍රණයක් සැකසීම”

## අරමුණු

- ගුවන්සේවා කටයුතු සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතන මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සඳහා පහසුකම් සැපයීම, සමායෝජනය, අධීක්ෂණය හා පසුවිපරම.
- ජාත්‍යන්තර තත්ත්වයට අනුකූල වන ලෙස සුරක්ෂිත බව සහ ආරක්ෂාව තහවුරු කරන තරගකාරී ගුවන්සේවා පහසුකම් පවත්වාගෙන යාම.
- ගුවන් මගී සහ ගුවන් භාණ්ඩ ප්‍රවාහන කටයුතු ප්‍රවර්ධනය කිරීම.
- අභ්‍යන්තර ගුවන්සේවා කටයුතු ප්‍රවර්ධනය කිරීම.
- ද්විපාර්ශවික හා බහුපාර්ශවික ජාත්‍යන්තර ගුවන්සේවා සාකච්ඡාවන් විවිධ රාජ්‍යයන්ගේ ගුවන් සංතරණ අධිකාරීන් සමඟ පැවත්වීම.
- ගුවන්සේවා කාර්යයන් ඉටුකිරීමේදී අනෙකුත් අමාත්‍යාංශ සමඟ අන්තර්සබඳතාවය පවත්වා ගැනීම.

## කාර්යසාධනය 2014

1) ගුවන් සේවා කර්මාන්තයේ ප්‍රගමනය සඳහා ක්ෂේත්‍රයට අදාල සියලු කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායීව අන්තර්ජාතික පිළිගැනීම සඳහා ඉටු කිරීමේ දී අවශ්‍ය නීති රෙගුලාසි සැකසීම, යාවත්කාලීන කිරීම හා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය දායකත්වය ලබා දෙන ලදී.

2) මෙම වසරේ දී අන්තර්ජාතිකව වාසි සහගත ගුවන් ගමනාන්ත මෙන්ම වාසි සහගත ගුවන් ගමන්වාර වැඩි කරගැනීම සඳහා ඒ ඒ රටවල් සමඟ ද්විපාර්ශවික ගුවන් සේවා සාකච්ඡා පැවැත්වීම හා ගිවිසුම් සඳහා එළඹෙන ලදී.

   - ගිවිසුම් යාවත්කාලීන කල රටවල්: සර්බියාව, බල්ගේරියාව, බ්‍රසීලය, හංගේරියාව, අයිස්ලන්තය, ඉරානය, ජැමෙයිකාව සහ කෙන්යාව
   - නව ගිවිසුම් :පෝලන්තය

3) මඩකලපුව අභ්‍යන්තර ගුවන් තොටුපල ඉදිකිරීම් කටයුතු සඳහා දායකත්වය ලබා දෙන ශ්‍රී ලංකා ගුවන් හමුදාව සහ මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා සම්බන්ධීකරණ කටයුතු කරමින් ව්‍යාපෘතිය මෙහෙයවීමේ කටයුතු සිදුකිරීම.

4) මගී සංතරණ කටයුතු සඳහා ඇති සීමිත ඉඩ කඩ පුළුල් කරමින් හා ගුවන් මගී පහසුකම් වර්ධනය කරමින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල දෙවන අදියර දෙවන පියවර ඉදිකිරීම් ව්‍යාපෘතියේ ආයතනික සම්බන්ධීකරණය හා ව්‍යාපෘතිය මෙහෙයවීමට දායකත්වය ලබා දීම.

5) අමාත්‍යාංශය යටතේ පවතින ජාතික ගුවන් සේවය වන ශ්‍රී ලංකන් ගුවන් සමාගම සහ අඩු පිරිවැය ගුවන් සේවය වන මිහින් ලංකා (පෞද්.) සමාගම සඳහා කෙරෙන ප්‍රාග්ධන දායකත්වය 2014 වසරේ දායකත්වය ලබා දීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම. තවද එම මූල්‍ය කළමනාකරණ කටයුතු සඳහා මඟපෙන්වීම හා පසුවිපරම් කටයුතු සිදුකරන ලදී.

6) ශ්‍රී ලංකන් ගුවන් සමාගමෙහි මූල්‍ය කළමනාකරණ කටයුතු විධිමත් කර ලාභ ඉපයීමේ ආයතනයක් ලෙස කටයුතු කිරීමට ආයතනයේ පස් අවුරුදු ව්‍යාපාරික සැලැස්ම (Five Year Business Plan) යාවත්කාලීන කිරීමට අදාල උපදේශක කමිටුව සඳහා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

7) ජාතික වැඩසටහනක් වන දැයට කිරුළ වැඩසටහන සඳහා අමාත්‍යාංශය යටතේ පවතින ආයතන සම්බන්ධීකරණය කරමින් මෙම වසරේ දැයට කිරුළ කාලසීමාව තුල සමාජ සත්කාරක වැඩසටහන් දියත් කිරීමට දායකත්වය ලබා දීම.

8) අමාත්‍යාංශය යටතේ ඇති ආයතන විසින් සිදු කරනු ලබන විවිධ කාර්යයන් තුල දී ඒවා බලාත්මක කිරීමට අදාල නීති,රෙගුලාසිමය කටයුතු සඳහා මැදිහත්ව අදාල අධිකාරි බලය ලබා දීමට කටයුතු කිරීම.

9) ගුවන් කේන්ද්‍රස්ථානය කරා යන ගමනේ දී අමාත්‍යාංශ විෂයට අයත්වන ගුවන් සේවා සංවර්ධන කටයුතු අනෙකුත් වාණිජ, දැනුම, බලශක්ති, නාවුක කේන්ද්‍රස්ථාන හා ඒකාබද්ධ සැලසුම් සඳහා ද දායකත්වය ලබා දෙන ලදී.

# විසර්ජන ගිණුම 2014

වියදම් ශීර්ෂ අංකය: 176        අමාත්‍යංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික්ලේකම් කාර්යාලයේ නම : සිවිල් ගුවන්සේවා අමාත්‍යවරයා

| වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය | වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩසටහනෙහි නම | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ. 66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මීම (4-5) | සටහන් අංකය (අදාළ ඩී.ජී.එස්.ඒ 2 ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| | **පුනරාවර්තන** | | | | | | | |
| 1 | මෙහෙයුම් ක්‍රියාකාරකම් | 171,000,000 | - | (2,100,000) | 168,900,000 | 160,310,752 | 8,589,248 | **2** |
| | උප එකතුව (පුනරාවර්තන) | **171,000,000** | **-** | **(2,100,000)** | **168,900,000** | **160,310,752** | **8,589,248** | |
| | **මූලධන** | | | | | | | |
| 1 | මෙහෙයුම් ක්‍රියාකාරකම් | 7,500,000 | - | 2,100,000 | 9,600,000 | 7,856,335 | 1,743,665 | **4,5** |
| 2 | සංවර්ධන ක්‍රියාකාරකම් | 13,500,000,000 | 13,112,908,000 | - | 26,612,908,000 | 26,445,778,052 | 167,129,948 | **19** |
| | උප එකතුව (මූලධන) | **13,507,500,000** | **13,112,908,000** | **2,100,000** | **26,622,508,000** | **26,453,634,387** | **168,873,613** | |
| | මුළු එකතුව | **13,678,500,000** | **13,112,908,000** | **-** | **26,791,408,000** | **26,613,945,139** | **177,462,861** | |

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය :

ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය :

ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ(මුදල්)/කොමසාරිස් (මුදල්)
නම :
දිනය :

# ව්‍යාපෘති අනුව පුනරාවර්තන වියදම්

වියදම් ශීර්ෂ අංකය : 176 අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : සිවිල් ගුවන්සේවා අමාත්‍යවරයා

වැඩ සටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් ක්‍රියාකාරකම්

| ව්‍යාපෘති අංකය / නම, පුද්ගලික පඩිනඩි සහ සියලුම ව්‍යාපෘති සඳහා අනෙකුත් වියදම් | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ.66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම් | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම් (4-5) |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ව්‍යාපෘති අංකය 01 හා නම : අමාත්‍ය කාර්යාලය | | | | | | |
| පුද්ගල පඩිනඩි | 17,200,000 | - | 2,153,000 | 19,353,000 | 18,982,021 | 370,979 |
| අනෙකුත් වියදම් | 37,680,000 | - | (11,585,500) | 26,094,500 | 25,428,259 | 666,241 |
| උප එකතුව | | | | | | |
| ව්‍යාපෘති අංකය 02 හා නම : අමාත්‍යාංශ පරිපාලනය | **54,880,000** | **-** | **(9,432,500)** | **45,447,500** | **44,410,280** | **1,037,220** |
| පුද්ගල පඩිනඩි | 28,350,000 | - | 410,000 | 28,760,000 | 25,184,957 | 3,575,043 |
| අනෙකුත් වියදම් | 87,770,000 | | 6,922,500 | 94,692,500 | 90,715,515 | 3,976,985 |
| උප එකතුව | **116,120,000** | | **7,332,500** | **123,452,500** | **115,900,472** | **7,552,028** |
| මුළු එකතුව | **171,000,000** | **-** | **(2,100,000)** | **168,900,000** | **160,310,752** | **8,589,248** |

ප්‍රධාන ගණකාධිකාරී/අධ්‍යක්ෂ (මුදල්)/කොමසාරිස් (මුදල්)

දිනය:-

ඩී.ජී.එස්.ඒ - 4

# වයාපෘති අනුව මූලධන වියදම්

වියදම් ශීර්ෂ අංකය : 176

වැඩ සටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් ක්‍රියාකාරකම්

වයාපෘති අංකය හා නාමය: 01 අමාත්‍ය කාර්යාලය

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : සිවිල් ගුවන්සේවා අමාත්‍යවරයා

| වැය ශීර්ෂ අංකය | අයිතම අංකය | මූලාශ්‍රය (සංකේත අංකය) | අයිතම් විස්තරය | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | (2) මු.රෙ.66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම්, පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2) | (4) මුළු වියදම | (5) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම් (3-4) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | රු. | රු. | රු. | රු. |
| | | | <u>මූලධන වියදම්වල විස්තර</u> | | | | | |
| | | | <u>මූලධන වත්කම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම</u> | | | | | |
| 2001 | | 11 | ගොඩනැගිලි සහ ඉදිරිකිරීම් | 100,000 | - | 100,000 | 100,000 | - |
| 2002 | | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 100,000 | - | 100,000 | 56,842 | 43,158 |
| 2003 | | 11 | වාහන | 2,500,000 | 1,850,000 | 4,350,000 | 3,331,619 | 1,018,381 |
| | | | <u>මූලධන වත්කම් අත්පත් කරගැනීම</u> | | | | | |
| 2102 | | 11 | ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 1,000,000 | - | 1,000,000 | 885,239 | 114,761 |
| 2103 | | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 500,000 | - | 500,000 | 498,926 | 1.074 |
| | | | එකතුව | **4,200,000** | **1,850,000** | **6,050,000** | **4,872,626** | **1,177,374** |

ප්‍රධාන ගණකාධිකාරී/අධ්‍යක්ෂ( මුදල් )/කොමසාරිස් (මුදල්)

දිනය:-

# ව්‍යාපෘති අනුව මූලධන වියදම්

වියදම් ශීර්ෂ අංකය : 176

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : සිවිල් ගුවන්සේවා අමාත්‍යවරයා

වැඩ සටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් ක්‍රියාකාරකම්

ව්‍යාපෘති අංකය හා නාමය: 02 අමාත්‍යාංශ පරිපාලනය හා ආයතන සේවා

| වැය විෂය අංකය | අයිතම අංකය | මූල්‍යකරණය (සංකේත අංකය) | අයිතම් විස්තරය | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | (2) මු.රෙ.66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම්, පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2) | (4) මුළු වියදම | (5) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම් (3-4) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | රු. | රු. | රු. | රු. |
| | | | මූලධන වියදම්වල විස්තර | | | | | |
| | | | මූලධන වත්කම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම | | | | | |
| 2001 | | 11 | ගොඩනැගිලි සහ ඉදිරිකිරීම් | 100,000 | 250,000 | 350,000 | 348,030 | 1,970 |
| 2002 | | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 100,000 | | 100,000 | 93,512 | 6,488 |
| 2003 | | 11 | වාහන | 1,000,000 | | 1,000,000 | 992,725 | 7,275 |
| | | | මූලධන වත්කම් අත්පත් කරගැනීම | | | | | |
| 2102 | | 11 | ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 500,000 | | 500,000 | 406,742 | 93,258 |
| 2103 | | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපරණ | 1,000,000 | | 1,000,000 | 1,000,000 | - |
| | | | හැකියා වර්ධනය | | | | | |
| 2401 | | 11 | පුහුණු කිරීම් හා හැකියා වර්ධනය | 600,000 | | 600,000 | 142,700 | 457,300 |
| | | | එකතුව | **3,300,000** | **250,000** | **3,550,000** | **2,983,709** | **566,291** |

ප්‍රධාන ගණකාධිකාරී/අධ්‍යක්ෂ (මුදල්)/කොමසාරිස් (මුදල්)

දිනය:-

# ව්‍යාපෘති අනුව මූලධන වියදම්

වියදම් ශීර්ෂ අංකය : 176

වැඩ සටහන් අංකය හා නාමය : 02 සංවර්ධන ක්‍රියාකාරකම්

ව්‍යාපෘති අංකය හා නාමය: 03 සිවිල් ගුවන්සේවා සංවර්ධනය

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : සිවිල් ගුවන්සේවා අමාත්‍යවරයා

| වැය විෂය අංකය | අයිතම අංකය | මූලාශ්‍රය (සංකේත අංකය) | අයිතම් විස්තරය | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | (2) මු.රෙ.66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම්, පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2) | (4) මුළු වියදම | (5) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම් (3-4) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | රු. | රු. | රු. | රු. |
| | | | <u>ප්‍රාග්ධනීකරණය - ශ්‍රී ලංකන් ගුවන් සමාගම</u> | | | | | |
| 7 | 2301 | 11 | ප්‍රාග්ධනීකරණය | 13,000,000,000 | 6,584,686,000 | 19,584,686,000 | 19,584,685,242 | 758 |
| | | | <u>ප්‍රාග්ධනීකරණය - මිහින් ලංකා ගුවන් සමාගම</u> | | | | | |
| 8 | 2301 | 11 | ප්‍රාග්ධනීකරණය | - | 6,528,222,000 | 6,528,222,000 | 6,528,221,130 | 870 |
| | | | <u>දේශීය ගුවන්තොටුපල සංවර්ධන ව්‍යාපෘතිය මඩකළපුව</u> | | | | | |
| 9 | 2104 | 11 | ගොඩනැගිලි ඉදිකිරීම | 500,000,000 | - | 500,000,000 | 332,871,680 | 167,128,320 |
| | | | එකතුව | 13,500,000,000 | 13,112,908,000 | 26,612,908,000 | 26,445,778,052 | **167,129,948** |

ප්‍රධාන ගණකාධිකාරී/අධ්‍යක්ෂ (මුදල්)/කොමසාරිස් (මුදල්)

දිනය:-

# සිවිල් ගුවන්සේවා අධිකාරිය

## දැක්ම

"ජාතික ආර්ථික වර්ධනය උදෙසා ප්‍රධාන උත්ප්‍රේරකයක් බවට පත්වීම"

## මෙහෙවර

"උපායමාර්ගික සැලසුම්කරණය සහ ප්‍රබලකර පාලනය මඟින් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සහ නිර්දේශිත පරිචයන්ට අනුගත, නිරුපද්‍රිත , සුරක්ෂිත සහ කාර්යක්ෂම ජාතික සිවිල් ගුවන්සේවා කර්මාන්තයක් මෙහෙයවීම සුසාධනය කිරීම"

<u>අරමුණු</u>

- රාජ්‍ය වෙත පැවරී ඇති සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයට අදාළ ජාත්‍යන්තර බැඳීම් සහ වගකීම් ඉටු කිරීම සහ නිර්දේශිත පරිචයන් නිතිපතා ක්‍රියාත්මක කරවීම
- සම්බාධක /සීමා පැනවීම් රහිත ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්සේවා පද්ධතිය ජාත්‍යන්තර පිළිගැනීමට ලක් කිරීම
- සිවිල් ගුවන්සේවාවෙහි නිරුපද්‍රිතතාව, සුරක්ෂිතතාව, කාර්යක්ෂමතාව, විධිමත්භාවය සහ පුද්ගල ආරක්ෂාව සහතික කිරීම
- ශ්‍රී ලංකා ගුවන් තලය ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ යහපත උදෙසා උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගැනීම
- රටෙහි ආර්ථික සංවර්ධනය
- අහේතුක තරගකාරිත්වය නිසා සිදුවන ආර්ථික අපතේ යාම වැලැක්වීම
- පුද්ගලයන්ගේ සහ භාණ්ඩවල පිවිසුම හා චලනය වැඩිදියුණු කිරීම
- සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රය තුළ විශ්වාස කටයුතු සේවා සැපයීම
- සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයෙහි අධ්‍යාපනය
- සිවිල් ගගන නාවික කාර්යන්හි සියලු අංශ කෙරෙහි අනුග්‍රහය දැක්වීම
- පොදු සෞඛ්‍ය ආරක්ෂා කිරීම හා වැඩි දියුණු කිරීම
- පරිසර සංරක්ෂණය සහතික කිරීම

1946 සිට පැවති සිවිල් ගුවන් සේවා දෙපාර්තුමේන්තුව අහෝසිකර 2002 අංක 34 දරණ සිවිල් ගුවන්සේවා අධිකාරිය පනත මඟින් වර්ෂ 2002 දෙසැම්බර් මස 27 වන දින සිට ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස පිහිටුවන ලදී. එය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තිය යටතේ අදාළ විගණන කාර්යයන් සඳහා රජයේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක්

වශයෙන් සළකනු ලැබේ. සිවිල් ගුවන් සේවා අධිකාරිය සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත වන අතර ඒ අතරින් පස්දෙනෙකු සිවිල් ගුවන් සේවා විෂයභාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන අතර තිදෙනෙක් නිල බලයෙන් පත්වනු ලැබේ.

ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයෙහි කටයුතු නියාමනය කිරීමේ වගකීම පැවරී ඇති ආයතනය වන්නේ සිවිල් ගුවන්සේවා අධිකාරියයි. ඒ අතරම, ශ්‍රී ලංකාව ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සම්මුතියෙහි පාර්ශවකරුවකු වශයෙන්, ක්‍රියාත්මක කිරීමට බැඳී ඇති චිකාගෝ සම්මුතියට අදාළ ඇමුණුම් 19 හි අඩංගු ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා ප්‍රමිතීන් සහ නිර්දේශිත ව්‍යවහාරයන් රටතුළ නීතිගත කිරීමට කටයුතු කර ක්‍රියාවට නැංවීමේ වගකීමද මෙම ආයතනයට පැවරී ඇත. එලෙසම පැහැදිලි හා සංෂික්ප්ත ගුවන් සුරක්ෂිතතා අවශ්‍යතාවයන් භාවිතයේ යෙදවීම සහ ක්‍රියා පටිපාටීන් ප්‍රවර්ධනය කිරීම සහ පැනවීම හෝ සම්මත කර ගැනීම, සහ ප්‍රමිතීන් සුරක්ෂිතව ක්‍රියාවේ යෙදවීම පිළිබඳව කටයුතු කිරීමට සිවිල් ගුවන් සේවා අධිකාරියට බලය පවරා තිබේ. තවද සිවිල් ගුවන් සේවා අධිකාරිය සිවිල් ගුවන් සේවාවේ සංවර්ධනයට සහ සිවිල් ගුවන්සේවා සම්බන්ධ ගැටළු වලට උපාය මාර්ගික උපදෙස් දීමටද බැඳී සිටියි.

## කාර්යසාධනය 2014

සමාලෝචනයට ලක්වන කාලසීමාව තුළ සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් සිදු කරන ලද කර්තව්‍යයන්හි ප්‍රමුඛත්වයක් ගන්නා ලද්දේ ප්‍රධාන වශයෙන් අන්තර්ජාතික සිවිල් ගුවන්සේවා ප්‍රමිතීන් සහ නිර්දේශිතයන් රටතුළ ක්‍රියාත්මක කිරීමට අදාළ කරුණු වේ. තවද සිවිල් ගුවන් සේවා නියාමන කටයුතු වලට යටත් වන්නාවූ සිවිල් ගුවන්සේවා කර්මාන්තකරුවන් සහතික කිරීම, නිති විමර්ශනය කිරීම සහ ඔවුන්ගේ අඩුපාඩු සහ දුර්වලතා නිවැරදි කිරීම් ද සිදු කරන ලදී. එමෙන්ම එම කාලසීමාව තුළ ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියට අදාළ කටයුතු මෙන්ම කාර්යමණ්ඩල පුහුණු කිරීම තුළින් ආයතනික ධාරිතාව ඉහළ නැංවීමට උත්සාහ දරන ලදී. එයට අමතරව සිවිල් ගුවන් සේවා අධිකාරියට අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතුද සිදු කරන ලදී.

අභ්‍යන්තර ගුවන්තොටුපොළ සංවර්ධනයට අදාළව පාලවී ගුවන් තොටුපලෙහි ධාවන පථය සැහැල්ලු ගුවන් යානා මෙහෙයුම් සඳහා යොදා ගැනීමේ ශක්‍යතාව පිළිබඳ මූලික අධ්‍යයන කටයුතු සිදු කිරීමට සිවිල් ගුවන් සේවා අමාත්‍යංශයට සහයෝගය දෙන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස සිවිල් ගුවන්සේවා අධිකාරිය නාගරික සංවර්ධන අධිකාරිය සමඟ සම්බන්ධ වෙමින් ධාවන පථයේ පුළුල් කිරීම් සහ නැවත ඉදිකිරීම් පිළිබඳව කටයුතු සිදු කරමින් පවතී. මඩකලපුව ගුවන් තොටුපොළහි ධාවන පථය පුළුල් කිරීමටත් මගීන් 60ක් රැගෙන යා හැකි MA 60 වර්ගයේ ගුවන් යානා මෙහෙයුම් කිරීමට හැකි පරිදි සංවර්ධනය කිරීමටත් අවශ්‍ය පියවර සිවිල් ගුවන්සේවා අමාත්‍යංශයේ මඟපෙන්වීම යටතේ සිදු කරන ලදී. කල්පිටිය ප්‍රදේශයේ ඕලන්ද කලපුවෙහි ජලජ යාත්‍රාංගනයක් සඳහා අනුමැතිය දීමේ කටයුතු සිදු කරමින් පවතී.

ගුවන්තොටුපොළ යටිතල පහසුකම් දියුණු කිරීමේ ප්‍රතිලාභ ගුවන් සමාගම් වලටද අවසානයේ ගුවන් මගීන්ටද ලැබේ. ගුවන් සමාගම් මෙහෙයුම් ඉහළ යාම රට තුළ ගුවන්සේවාවේ වර්ධනයෙහි ධනාත්මක සලකුණකි. 2014 දෙසැම්බර් අග වන විට ශ්‍රී ලංකාවේ ගුවන් මෙහෙයුම් සහතික දරන්නන් 09ක් ක්‍රියාකාරී මෙහෙයුම් වල යෙදී සිටින ලදී. මෙම මෙහෙයුම් කරුවන්ගෙන් 02ක් ජාත්‍යන්තර ගුවන් මගී ප්‍රවාහන කටයුතු වලද එක් මෙහෙයුම් කරුවකු ජාත්‍යන්තර භාණ්ඩ ප්‍රවාහන කටයුතු වලද යෙදෙන අතර ඉතිරි 06 දෙනා අභ්‍යන්තර ගුවන් මෙහෙයුම් පමණක් සිදුකරනු ලැබේ.

නව විදේශීය ගුවන් මෙහෙයුම් සමාගම් ලෙස රොටානා ජෙට් (Rotana Jet) , ට්‍රාන්ස් එයරෝ (Transaero) සඳහා ගුවන් මෙහෙයුම් සහතිකය නිකුත් කිරීම මඟින් ජාත්‍යන්තර ගුවන් ගමන් වර්ධනයට දායක වී ඇත. ගමනාන්ත 43 ක් දක්වා කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල හා  හා මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ භාවිත කරමින් ගුවන් සමාගම් 24 ක් ගුවන් ගමන් සිදුකර ඇත. 2013/2014 ශීත ඍතුව තුළ, නියමිත කාලසටහනක් නොමැති ගුවන් යානා 6 ක් මඟින් යුරෝපයේ සිට සංචාරකයින් රැගෙන එන ලදී. එමෙන්ම සංචාරකයින්ගේ මෙම පැමිණීමේ ප්‍රවණතාවය වැඩිවීමත් සමඟ 2014/2015 ශීත ඍතුවේදී ශ්‍රී ලංකාවට කාලසටහනක් නොමැති ජාත්‍යන්තර ගුවන් සමාගම්හි සේවාවන් ලැබීමටද අපේක්ෂා කරනු ලැබේ.

ගුවන් මෙහෙයුම් සමාගම් සහතික කරන අවස්ථාවේදී පැවති ප්‍රමිතීන් එලෙසම පවත්වාගෙන යන බවට සහතික වීම සඳහා නියාමන විගණන, රැම්ප් පරීක්ෂණ, අතරමග පරීක්ෂණ මෙහෙයුම්, ප්‍රධාන මධ්‍යස්ථාන පරීක්ෂණ, ගඟන නාවික තොරතුරු සේවා පරීක්ෂණ , ගුවන් ගමන් පාලක පරීක්ෂණ, ගඟන යාත්‍රාංගන පරීක්ෂණ, ඇතුලු විමර්ශන 499 ක් සමාලෝචනයට  ලක්වන කාල සීමාව තුළ සිදුකර ඇත.

ගුවන්යානයක ගුවන් යෝග්‍යතාව ගුවන් සුරක්ෂිතතාවය පවත්වාගැනීමට අවශ්‍ය වැදගත් සාධකයකි. සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි ප්‍රධාන වගකීමක් වන්නේ රටෙහි ගුවන්සේවා කර්මාන්තයෙහි අඛණ්ඩ නිරුපද්‍රිතතා කාර්යසාධනය පවත්වා ගැනීමට බලපාන ගුවන් යෝග්‍යතා අංගයන් වන ගුවන් ප්‍රවාහන මෙහෙයුම්කරුවන්, අනුමත නඩත්තු සංවිධාන සහ පුද්ගලයින් හෝ ආයතන වැඩිදියුණු කිරීම, අලුත් වැඩියා සිදුකිරීම්, ගුවන් යානා සහ එහි සංරචක නඩත්තු කිරීම්, අදාළ පුද්ගලයින් පුහුණු කිරීම සිදු කිරීමයි.

ගුවන් යෝග්‍යතාවයට අදාළ නියාමන කාර්යයන් ලෙස නව ගුවන් යානා දහසයක් (16) ලියාපදිංචි කරන ලද අතර ගුවන් යානා පනස් හතරක (54) ක ලියාපදිංචිය අලුත් කරන ලදී. විමර්ශන කාර්යයන් එකසිය අනූ දෙකක් (192) ක් පවත්වන ලද අතර වැඩපොළ අනුමැතීන් දොළහක් (12) ලබා දී ඇත. ගුවන් යෝග්‍යතා සහතික දහහතරක් (14) නිකුත් කරන ලද අතර පනස් දෙකක් (52) අලුත් කරන ලදී. ගුවන් සේවා සිදුවීම් 127 ක් සමථයකට පත් කරන ලදී.

ගුවන් නිරුපද්‍රිතතා ක්ෂේත්‍රයෙහි පියසරයන්, ගුවන්යානා නඩත්තු කිරීම් සහ ගුවන් ගමන් පාලන කටයුතු යනාදී කාර්යයන්හි නිරතවන පුද්ගලයින්ට සහතික නිකුත් කිරීම හා ඔවුන්ගේ හැකියාවන් පවත්වාගෙන ගැනීම ප්‍රධාන නියාමන කාර්යයකි.

පුද්ගල බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියට පුහුණු ආයතන සහ පුහුණු පාඨමාලා අනුමත කිරීම් සහ අදාළ විභාග පැවැත්වීම්, අවශ්‍ය පරිදි උපදේශකයින් සහ පරීක්ෂකයින් අනුමත කිරීම, ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ සහ වෛද්‍ය පරීක්ෂණ පැවැත්වීම යනාදිය අඩංගු වේ. ඉහත ඇතැම් කරුණු වලට අදාලව බලපත්‍ර අලුත් කිරීම්ද සිදු කර ඇත.

සමාලෝචනයට භාජනය වන කාලසීමාව තුළ ශිෂ්‍ය පුහුණු නියමු බලපත්‍ර 100 ක්ද, පෞද්ගලික නියමු බලපත්‍ර 64 ක්ද, වාණිජ නියමු බලපත්‍ර 62 ක්ද, වෘත්තීය ගුවන් නියමු බලපත්‍ර 19 ක්ද, ඇතුලු පුද්ගල බලපත් සහ සහතික පත් 245 ක් නිකුත් කර ඇත. තවද සියලුම වර්ග වලට අයත් ගුවන් නියමු බලපත්‍ර 851 ක් ද අලුත් කර ඇත. මෙයට අමතරව ගුවන් යානා නඩත්තු බලපත්‍ර 32 ක් ද, ගුවන් ගමන් පාලක බලපත්‍ර 12 ක්ද, පියසර මෙහෙයුම් නිලධාරී බලපත්‍ර 01ක් සහ මැදිරි සේවක පිරිස් සහතික 77 ක් ද නිකුත් කර ඇත. බලපත්‍ර අලුත් කිරීම් යටතේ ගුවන් යානා නඩත්තු ඉංජිනේරු බලපත්‍ර 404 ක්, ගුවන් ගමන් පාලක බලපත්‍ර 38 ක් ද මැදිරි සේවක පිරිස් සහතික 57ක්ද නිකුත් කර ඇත.

ගුවන් සමාගම් මෙහෙයුම්, නඩත්තු සංවිධාන අනුමැතීන් සහ පියසර පුහුණු පාසැල් සහතික කිරීම් වලට අදාල 2014 වාර්ෂික විමර්ශන කටයුතු 100% ක් නිම කර ඇත.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ වාර්ෂික විමර්ශන වැඩසටහනට අනුව ගුවන් සේවා ආරක්ෂණ වැඩසටහන් සිදුකරන ලදී.

ගුවන් තොටුපොළ ආරක්ෂණ සේවා සපයන්නන් සහතික කිරීම ගුවන් තොටුපොළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම හා එක්ව සිදු කරන ලදී. ගුවන් සේවා සුරක්ෂිතතා කළමණාකරුවන් 09, ගුවන් සේවා සුරක්ෂිතතා උපදේශකයින් 03ක්, සහ සුරක්ෂිතතා සෝදිසි කරන්නන් 81ක් සහතික කරන ලද අතර එම සුරක්ෂිතතා සෝදිසි කරන්නන් 490 දෙනෙකුගේ සහතික අලුත් කරන ලදී. මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොළහි ආරක්ෂක කටයුතු සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි නව මගී පර්යන්තය ඉදිකිරීමේ සැලැස්ම සම්බන්ධයෙන් සිවිල් ගුවන් සේවා අධිකාරිය කටයුතු කරන ලදී.

ශ්‍රී ලංකාවේ මෙන්ම විදේශීය ගුවන් සමාගම් සඳහා නව ගමනාන්ත මාර්ග විවර කරමින් බ්‍රසීලය, බල්ගේරියාව, පෝලන්තය, ඕමානය සහ සර්බියාව යන රටවල් සමඟ ද්වීපාර්ශවික ගුවන් සේවා සාකච්ඡා සිදු කරන ලදී. මෙය රටෙහි ආර්ථිකය හා සංචාරක කර්මාන්තයේ වර්ධනයට රුකුලක් වනු ඇත.

නව සංචාරක නියෝජිත ආයතන 106 ක් සඳහා බලපත්‍ර ලබා දී ඇති අතර ආයතන 444 ක බලපත්‍ර අලුත් කරන ලදී. මෙය ප්‍රවාහන ක්ෂේත්‍රයේ නව රැකියා අවස්ථා සහ ව්‍යාපාර ජනිත කිරීමට පිටිවහලකි. සංචාරක කර්මාන්තයට අවශ්‍ය මනා පුහුණුවකින් යුත් මානව සම්පත් බිහි කිරීම සඳහා සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් පවත්වනු ලබන ආසන වෙන් කිරීමේ සහ ගාස්තු ගණනය කිරීමේ පාඨමාලාවෙහි නමවැන්න 2014 දී සම්පූර්ණ කරන ලදී. අනුමත නොකරන ලද ගුවන් ප්‍රවාහන සමාගම් හා සංචාරක නියෝජිතවරුන්ට එරෙහිව ඉදිරිපත් කරන ලද පැමිණිලි ගැන කටයුතු කරන ලදී. මීට අමතරව 1999 මොන්ට්‍රියල් සම්මුතියෙන් සම්මත කරගත් ගුවන් මගියාගේ භාණ්ඩ හානිවූ විට ගෙවීම් සිදු කිරීම ශ්‍රී ලංකාව තුළ බලාත්මක කිරීම සඳහා අවශ්‍ය මූලික නීති කෙටුම්පත විධිමත් කිරීමේ කටයුතු සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යොමු කරන ලදී. එය 2014 අගභාගයේදී අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද උප කමිටුව වෙත ඉදිරිපත් කරන ලද අතර 2015 දී නීතිගත කිරීමට බලාපොරොත්තු වේ.

සිවිල් ගුවන් සේවා අධිකාරියේ විෂය පථය ගත් කළ එහි සුවිශේෂි වූ මානව සම්පත් අවශ්‍යතාවයක් වන්නේ සේවකයන්හට ලබා දිය යුතු පුහුණුවීම් වැඩසටහන්ය. මෙහිදී ආයතනයේ තාක්ෂණික සහ විධායක ශ්‍රේණි නිලධාරීන් සඳහා සකස් කරන ලද විශේෂ පුහුණු සැලැස්මක් ක්‍රියාත්මක වේ. මෙම සැලැස්ම භාවිත කරමින් වාර්ෂිකව විධායක නිලධාරීන්ටද, තාක්ෂණික නිලධාරීන්ටද පොදුවේ ගත්කළ අනෙකුත් සියලු මට්ටම් වල සේවකයින් සඳහා ද වූ වාර්ෂික පුහුණු වැඩසටහනක් සෑම වසරකම අධිකාරියෙහි අනුමැතිය යටතේ ක්‍රියාත්මක වේ. මේ වසර තුළදී විදේශීය පුහුණු අවස්ථා 71 ක්ද, දේශීය පුහුණු අවස්ථා 148 ක්ද, පිළිවෙලින් රුපියල් මිලියන 13.1ක හා රුපියල් මිලියන 1.3 ක වියදමක් දරා ලබාදී ඇත. මෙයට අමතරව ජාත්‍යන්තර ගුවන් සේවා කර්මාන්තය සමඟ ගනුදෙනු කිරීම සඳහා විදේශීය රැස්වීම් සම්මන්ත්‍රණ හා වැඩමුළු වලට සහභාගී වීම සඳහා රුපියල් මිලියන 11.7 ක් වැය කර ඇත. අර්ධ රාජ්‍ය ආයතනයක් ලෙස රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුකූලව සිවිල් ගුවන් සේවා අධිකාරියේ ආයතනික සැලැස්ම ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සඳහා මේ වන විට කළමනාකරණ දෙපාර්තමේන්තුව සහ වැටුප් කොමිසම සමඟ සාකච්ඡා ගණනාවක් පවත්වා ඇති අතර තවමත් කටයුතු නිම වී නැත.

සිවිල් ගුවන්සේවා අධිකාරියේ කාර්යමණ්ඩල රීති සහ පරිපාලන ක්‍රියාපටිපාටි සංග්‍රහයෙහි (SLCAP 5000) අඩංගු කරුණු පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා කැබිනට් මණ්ඩලය විසින් පත්කරන ලද නිලධාරී කමිටුව විසින් සකස් කරන ලද වාර්තාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. ඒ අනුව අදාළ සංශෝධනයන් කාර්යමණ්ඩල රීති සහ පරිපාලන ක්‍රියා පටිපාටි සංග්‍රහයට අන්තර්ගත කිරීමෙන් අනතුරුව මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද සංශෝධිත ගාස්තු සහ අයකිරීම් ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් අනතුරුව 2014 අගෝස්තු 01 වනදා සිට ක්‍රියාත්මක කර ඇත.

තවද සිවිල් ගුවන් සේවා අධිකාරිය අනාගත ගුවන් සේවාවට අවශ්‍ය පිරිස් බලය වර්ධනය කිරීමට අවශ්‍ය ව්‍යාපෘතියක්ද අරඹා ඇත. සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රය පිළිබඳ දැනුම පාසැල් දරුවන් අතර බෙදා දීම සඳහා සිවිල් ගුවන් සේවා සංවර්ධන හා අධ්‍යාපනික කමිටුව පිහිටුවන ලදී. ගුවන් සේවා ක්ෂේත්‍රය පිළිබඳ සිසු දැනුම වැඩි දියුණු කිරීමේ අරමුණින් සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් මුද්‍රණය කරනු ලබන 'ගුවන්සර' ත්‍රෛමාසික අධ්‍යාපනික සඟරාව උසස් පෙළ පන්ති පවත්වන පාසල් 2808 ක් සඳහා බෙදා දී ඇත. ඊට අමතරව හඳුනාගත් වෙනත් ආයතන 486 ක් සඳහා ද එය ලබා දී ඇත.

මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ ඉදිකිරීමත් සමඟ සිවිල් ගුවන්සේවා අධිකාරිය වෙත පැවරී ඇත නියාමන රාජකාරීන් වඩා කාර්යක්ෂමව හා නොපිරිහෙලා ඉටු කිරීම සඳහා අවශ්‍ය කාර්යාලයක් මත්තල රාජපක්ෂ ගුවන් ගුවන්තොටුපළ පරිශ්‍රයෙහි ඉදිකිරීමෙන් අනතුරුව 2014 ජුනි මාසයේදී එය විවෘත කරන ලදී.

සිවිල් ගුවන් සේවා අධිකාරිය සඳහා ප්‍රධාන ගොඩනැගිල්ලක් කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ පරිශ්‍රයේ ඉදි කිරීම සඳහා අවශ්‍ය කටයුතු තවදුරටත් සිදු කරන ලද අතර රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීමේ ක්‍රියාවලිය මේ වන විට අවසන් කර ඇති අතර 2016 වන විට එය නිම කිරීමට අපේක්ෂා කෙරේ.


සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි පරීක්ෂකවරුන්ට සහ කාර්යමණ්ඩල සාමාජිකයන්ගේ අවශ්‍යතාවය පරිදි නවාතැන් ගැනීම සඳහා නිවාස 04 ක් ඉදිකිරීමේ කටයුතු පෙබරවාරි මසදී වීරවිල දී ආරම්භ කරන ලද අතර එහි ඉදිකිරීම් කටයුතු 2014 ඔක්තෝබර් මස නිම කරන ලදී.

# ආදායම් /වියදම් ප්‍රකාශය


2014 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

| | රු .මි |
|---|---|
| **ආදායම** | **1,474** |
| ලංකාවෙන් පිටත විකිණූ ගුවන් ටිකට්පත් අධිභාරය | 1,160 |
| අපගමන බදු සේවා ගාස්තු | 137 |
| නියාමන සේවා | 60 |
| පොළී ආදායම | 104 |
| වෙනත් ආදායම් | 13 |
| **වියදම්** | **347** |
| කාර්ය මණ්ඩල වියදම් | 169 |
| රැස්වීම්, වැඩමුළු, සම්මන්ත්‍රණ | 15 |
| පුහුණු | 10 |
| පරිපාලන සහ වෙනත් වියදම් | 131 |
| ක්ෂය වීම් | 22 |
| **බදු ගෙවීමට පෙර සාමාන්‍ය කටයුතු වලින් ලාභය** | **1,127** |
| ආදායම් බදු | 314 |
| බදු ගෙවීමෙන් පසු ශුද්ධ ලාභය | 813 |
| **බදු සහ වෙන් කිරීම් පසු ලාභය** | **813** |
| වර්ෂ ආරම්භයේ ලාභය (01.01.2014) | 390 |
| මහා භාණ්ඩාගාරයේ සමුච්චිත අරමුදලට දායක වීම | (250) |
| පොදු සංචිතයට මාරු කිරීම් | (715) |
| ප්‍රත්‍යාගණන අතිරික්තයට කළ ගැලපීම් | 5 |
| **ඉදිරියට ගෙන යන ලාභය** | **243** |

මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - සිවිල් ගුවන්සේවා අධිකාරිය




මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - සිවිල් ගුවන්සේවා අධිකාරිය




මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - සිවිල් ගුවන්සේවා අධිකාරිය

# සී/ස ගුවන්තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම

## දැක්ම

"ආසියානු කලාපය තුල කාර්යක්ෂම බවින් හා සුහදත්වයෙන් ප්‍රමුඛතම ගුවන්සේවා කේන්ද්‍රස්ථානය වීම"

## මෙහෙවර

"අප විසින් මහත් පරිශ්‍රමයක් දරනුයේ ප්‍රශස්ත ක්‍රියාකාරකම් තුලින් තරගකාරී ගුවන්සේවා පහසුකම් සැපයීම මෙන්ම අපගේ ආයතනය කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශවයන්ගේ සංතෘප්තිය තහවුරු කිරීමටයි"

**ආයතනික පරමාර්ථ**

1 සංක්‍රමණික මගීන් ගණන මුළු මගීන් ගණනෙහි අනුපාතිකය වර්තමානයේ 1:6 සිට 1:4 දක්වා වර්ධනයකර බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල ආසියා ශාන්තිකර කලාපයේ මගී සංක්‍රමණික මධ්‍යස්ථානය බවට පත් කිරීම.

2 2016 වනවිට මිලියන 12 ක මගී සංඛ්‍යාවක් හැසිරවීමේ ධාරිතාවයකින් යුත් යටිතල පහසුකම් නගා සිටුවීම.

3 2016 වනවිට ගොඩ බසින ගුවන් යානයකට සපයනු ලබන සේවා වෙනුවෙන් දරනු ලබන වැය 13% කින් අවම කිරීම.

4 2015 වනවිට හසුරුවන ගුවන් මගීන් සංඛ්‍යාව මිලියන 9 දක්වා ඉහළ නැංවීම.

5 2015 වනවිට මුළු ගුවන් භාණ්ඩ ප්‍රමාණයෙන් (බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල හා මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපල) 40% ක් සංක්‍රමණික භාණ්ඩ බවට පත්කර ගැනීම.

6 සිවිල් ගුවන්සේවා පුහුණු මධ්‍යස්ථානය තුල කලාපීය සහභාගිත්වය 10% කින් වර්ධනය කර ගැනීම.

7 කලාපය තුල ශ්‍රේණිගත වීම වර්ධනය කර ගැනීමේ ප්‍රවණතාවයක් පවත්වා ගැනීම.

8 ගුවන් යානා සිදුවීම් වල පහල බැස්වීමේ ප්‍රවණතාවයක් පවත්වා ගැනීම.

9 ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය (ICAO) විසින් නිකුත් කර ඇති ලේඛන 8973 ප්‍රකාර ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවාවේ සුරක්ෂිතභාවය සහතික කිරීම.

10 ආයතනික යතුරු පුවරුවෙහි පාරිභෝගික හා මූල්‍යමය පර්යාලෝක මිනුම්දඬු සඳහා 20% ක අවමයක් පවත්වා ගනිමින් ගුවන් තොටුපල හා බැඳුණු සියලු ආයතනයන් හා ඒකාබද්ධව සේවා සැපයීම, ඇගයීම හා මෙහෙයුම් විශිෂ්ට අයුරින් නොකඩවා සැපයීම.

# කාර්යසාධනය 2014

**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල**

මෙහෙයුම් මට්ටම් වල හදිසි ඉහල නැඟීම සහ එහි ප්‍රතිඵල වූ, ගුවන් තදබද සංරචක සමඟ තදබද සහසම්බන්ධතාවක් දක්වන ආදායම හා ඉපැයුම් ඉහල නැගීම නිසා ඇති වූ උද්යෝගය සමඟම 2014 වර්ෂයේදී ගුවන්තොටුපල හා ගුවන්සේවා සමාගම විශිෂ්ට ජයග්‍රහණයක් සලකුණු කරන ලදී.

ගුවන් තදබද දත්ත චලනයක් පහත පෙන්වන අතර සමාගමේ මූලා වාර්තා වල ප්‍රධාන මූලා දර්ශක වල මෙම මෙහෙයුම් දත්ත පහත දැක්වේ.

**ගුවන් යානා සංතරණ**

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල 2014 කාලපරිච්ඡේදය තුලදී ගුවන්යානා 52,620 (කාල සටහන් කරන ලද ගුවන්යානා, 50,162 සහ කාල සටහන් නොකරන ලද ගුවන්යානා 2,458) හැසිරවිය. මෙය 2013 වර්ෂයට සාපේක්ෂව 4% වර්ධනයකි.

**මගී සංතරණ**

සංක්‍රමණික මගීන් 1,283,806 ක් ඇතුලුව මගීන් 7,766,491 (ආපසු යන මගීන් 3,912,745 ක් හා පැමිණෙන මගීන් 3,853,746 ක්) ගුවන්තොටුපල භාවිතා කල අතර,එය 2013 වර්ෂයට සාපේක්ෂව 6% වර්ධනයනකි.

**ගුවන් භාණ්ඩ සංතරණ**

කාලපරිච්ඡේදය තුල මුළු ගුවන් බඩු ප්‍රමාණය මෙට්‍රික් ටොන් 209,417 කි. (අපනයන ගුවන් බඩු මෙට්‍රික් ටොන් 131,669 හා ආනයන ගුවන් බඩු මෙට්‍රික් ටොන් 77,748) පෙර වර්ෂය හා සසඳන කල 8% වර්ධනයක් පවතී.

**මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි මෙහෙයුම් ක්‍රියාකාරකම්**

ගුවන් සමාගමක් වශයෙන් ආයතනික ජීව චක්‍රයේ හඳුන්වාදීමේ අවධියේ සිටින මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපල දැනටමත් ගුවන් ගමන්වාර සහ මගී ගමන්වාර යන දෙඅංශයෙන්ම ක්‍රමික වර්ධනයක් පෙන්වයි. ගුවන් තදබද දත්ත පහත දක්වා ඇත. ජාතික ගුවන්සේවය, මිහින් ලංකා, ෆ්ලයි ඩුබායි සහ රොටානා ජෙට් ගුවන්සේවය මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල සහ තවත් බොහෝ අන්තර්ජාතික ගුවන්තොටුපලවල් සමඟ ඒකාබද්ධව සතිපතා ගුවන් මෙහෙයුම් ක්‍රියාත්මක වන අතර, රට අභ්‍යන්තර ගුවන් මෙහෙයුම්ද ඒ සමඟම ක්‍රියාත්මක වේ.

**ගුවන් යානා සංතරණ**

මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි 2014 කාලපරිච්ඡේදය තුලදී ගුවන්යානා 2,734 ක් හැසිරවනු ලැබීය.

**මගී සංතරණ**

එම කාලපරිච්ඡේදයේදී ගුවන් තොටුපල සංක්‍රමණික මගීන් 7,158 ක් ඇතුලුව මගීන් 40,386 (ආපසු යන මගීන් 22,530 ක් හා පැමිණෙන මගීන් 17,856 ක්) භාවිතා කර ඇත.

**ගුවන් භාණ්ඩ සංතරණ**

ඉහත කාල සීමාව තුල මුළු ගුවන් බඩු ප්‍රමාණය මෙට්‍රික් ටොන් 221.5 (අපනයන ගුවන් බඩු මෙට්‍රික් ටොන් 6.6 ක් සහ ආනයන ගුවන් බඩු මෙට්‍රික් ටොන් 214.9 කි.

**ආදායම් ප්‍රකාශය**
**2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා**


| | **2014** විගණනය නොකල | **2013** විගණනය කල |
|---|---|---|
| ආදායම | 13693 | 12,083 |
| මෙහෙයුම් වියදම | (9134) | (9021) |
| **මෙහෙයුම් ලාභය** | **4559** | **3062** |
| එකතු කලා | | |
| මූල්‍ය ආදායම | 1876 | 2428 |
| | **6435** | **5490** |
| අඩු කල | | |
| මූල්‍ය වියදම | (700) | (574) |
| **බදු පෙර ලාභය** | **5735** | **4916** |
| අඩු කලා | | |
| බදු | (2409) | (1192) |
| **බදු ගෙවූ පසු ලාභය** | **3326** | **3724** |
| | | |
| **ප්‍රාග්ධන වියදම්** | **1039** | **6378** |

මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - ගුවන්තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම

ගුවන්යානා සංතරණ

| | 2014 | 2013 | 2012 | 2011 | 2010 | 2009 | 2008 |
|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | 4,608 | 4,230 | 4,156 | 3,480 | 2,704 | 2,534 | 3,036 |
| පෙබරවාරි | 4,182 | 3,816 | 3,876 | 3,178 | 2,510 | 2,198 | 2,670 |
| මාර්තු | 4,532 | 4,218 | 4,048 | 3,644 | 2,730 | 2,366 | 2,820 |
| අප්‍රේල් | 4,386 | 4,002 | 3,832 | 3,544 | 2,692 | 2,242 | 2,806 |
| මැයි | 4,280 | 4,196 | 3,922 | 3,578 | 2,686 | 2,316 | 2,742 |
| ජුනි | 4,200 | 4,104 | 3,874 | 3,546 | 2,650 | 2,222 | 2,554 |
| ජූලි | 4,290 | 4,326 | 4,094 | 3,746 | 2,904 | 2,432 | 2,650 |
| අගෝස්තු | 4,474 | 4,394 | 4,232 | 3,740 | 2,896 | 2,478 | 2,616 |
| සැප්තැම්බර් | 4,300 | 4,182 | 4,000 | 3,570 | 2,812 | 2,318 | 2,480 |
| ඔක්තෝම්බර් | 4,372 | 4,396 | 4,190 | 3,872 | 2,984 | 2,416 | 2,480 |
| නොවැම්බර් | 4,414 | 4,334 | 3,994 | 3,632 | 3,118 | 2,454 | 2,374 |
| දෙසැම්බර් | 4,582 | 4,604 | 4,198 | 3,924 | 3,402 | 2,640 | 2,536 |
| | **52,620** | **50,802** | **48,416** | **43,454** | **34,088** | **28,616** | **31,764** |

මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - ගුවන්තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම





මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - ගුවන්තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම

ගුවන් මගී සංතරණ

| | 2014 | 2013 | 2012 | 2011 | 2010 | 2009 | 2008 |
|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | 703,167 | 643,234 | 602,010 | 511,488 | 439,386 | 367,097 | 491,112 |
| පෙබරවාරි | 612,792 | 583,249 | 558,826 | 462,367 | 393,325 | 305,542 | 368,021 |
| මාර්තු | 642,341 | 610,150 | 595,441 | 504,324 | 433,030 | 327,003 | 398,536 |
| අප්‍රේල් | 637,542 | 585,104 | 579,872 | 512,548 | 415,208 | 335,382 | 432,945 |
| මැයි | 599,599 | 579,448 | 561,350 | 473,328 | 388,654 | 304,984 | 409,723 |
| ජූනි | 605,515 | 583,731 | 570,231 | 468,430 | 404,140 | 317,946 | 389,367 |
| ජූලි | 628,858 | 612,323 | 611,582 | 553,022 | 475,509 | 369,595 | 383,431 |
| අගෝස්තු | 741,390 | 688,600 | 647,589 | 582,509 | 481,089 | 404,631 | 388,129 |
| සැප්තැම්බර් | 625,532 | 586,628 | 569,427 | 506,047 | 430,166 | 342,507 | 323,081 |
| ඔක්තෝම්බර් | 628,864 | 606,953 | 590,627 | 511,123 | 430,893 | 364,190 | 330,361 |
| නොවැම්බර් | 612,007 | 566,284 | 554,095 | 473,711 | 445,911 | 369,042 | 332,216 |
| දෙසැම්බර් | 728,884 | 666,165 | 638,870 | 586,635 | 522,337 | 434,443 | 395,909 |
| | 7,766,491 | 7,311,869 | 7,079,920 | 6,145,532 | 5,259,648 | 4,242,362 | 4,642,831 |

මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - ගුවන්තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම





මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - ගුවන්තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම

ගුවන් භාණ්ඩ සංතරණ

| | 2014 | 2013 | 2012 | 2011 | 2010 | 2009 | 2008 |
|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | 15,518 | 14,806 | 13,906 | 13,838 | 12,538 | 9,923 | 13,061 |
| පෙබරවාරි | 13,987 | 14,558 | 14,156 | 12,534 | 12,600 | 9,358 | 13,312 |
| මාර්තු | 17,882 | 18,228 | 17,051 | 15,827 | 15,167 | 11,358 | 15,341 |
| අප්‍රේල් | 15,766 | 15,162 | 15,050 | 13,479 | 12,990 | 10,176 | 12,635 |
| මැයි | 17,254 | 15,932 | 15,875 | 13,340 | 14,053 | 11,360 | 12,860 |
| ජූනි | 17,700 | 16,162 | 16,005 | 13,392 | 13,582 | 10,982 | 13,517 |
| ජූලි | 19,145 | 17,544 | 17,243 | 14,752 | 15,133 | 12,280 | 13,921 |
| අගෝස්තු | 17,848 | 16,323 | 15,945 | 14,190 | 14,704 | 11,459 | 12,548 |
| සැප්තැම්බර් | 17,822 | 16,131 | 15,056 | 13,651 | 13,640 | 10,746 | 12,201 |
| ඔක්තෝම්බර් | 18,732 | 16,783 | 15,556 | 14,535 | 14,007 | 11,462 | 11,264 |
| නොවැම්බර් | 19,003 | 16,405 | 14,869 | 13,864 | 14,130 | 12,791 | 10,709 |
| දෙසැම්බර් | 18,761 | 15,941 | 15,906 | 15,175 | 14,586 | 16,172 | 10,583 |
| | **209,417** | **193,975** | **186,618** | **168,577** | **167,130** | **138,067** | **151,952** |

මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - ගුවන්තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම




මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - ගුවන්තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම

# ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම.

## දැක්ම

"ආසියාවේ ප්‍රියතම ගුවන් සේවය බවට පත්වීම"

## මෙහෙවර

"අප මගී සහ භාණ්ඩ ප්‍රවාහනයේ යෙදී සිටින අතර අපගේ පාරිභෝගිකයින්ට විශ්වාසය තැබිය හැකි ප්‍රසන්න අත්දැකීමක් විඳගැනීමට සලස්වා ඇත. අපගේ ව්‍යාපාරික ගනුදෙනුකරුවන්හට නවීකරණය වූත්, වෘත්තීය තත්ත්වයෙන් උසස් වූත්, ලාභ ඉපැයීය හැකි සේවා සපයන්නෙමු. අපගේ කොටස්කරුවන්ගේ අපේක්ෂාව වන ලාභ ඉපැයීය හැකි සේවා සපයන්නෙමු. අපගේ කොටස්කරුවන්ගේ අපේක්ෂාව වන ලාභ ඉපයීම පරමාර්ථ කරගෙන අප විසින් ශ්‍රී ලංකාවට සංචාරකයින් ප්‍රවාහනය කිරීමේ ප්‍රවර්ධනය කටයුතු සිදු කරන අතර අප සමාජයේ සුභසාධනය පිණිස ද දායක වන්නෙමු. අප සතුව කාර්යක්ෂම ප්‍රායෝගිකව කටයුතු කරන කාර්යශීලි කණ්ඩායමක් ඇති අතර අප විසින් සංචාරක කර්මාන්තයට දක්වන ලද දායකත්වය වෙනුවෙන් කීර්තිය සහ ප්‍රශංසාවට පත්වී ඇත."

අරමුණු

- ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති වලට සමීප සහයෝගීතාවයක් දක්වමින් දේශීය ආර්ථිකය නංවාලමින් ශ්‍රීලංකන් ගුවන් සේවය ලොව වටා ප්‍රවර්ධනය කිරීම.

- මහින්ද චින්තන ඉදිරිදැක්ම වැඩසටහනේ දක්වා ඇති පරිදි වාණිජ හා දැනුම් ක්ෂේත්‍රයන්හි කේන්ද්‍රස්ථානයක් බවට ශ්‍රීලංකාව ගුවන්සේවා කර්මාන්තය තුළ සංවර්ධනයකිරීම
- දේශීය සංචාරක කර්මාන්තයේ උන්නතිය සඳහා ක්‍රියාකාරී උත්ප්‍රේරකයක් ලෙසදායකත්වය ලබාදීම.
- ආනයන හා අපනයන යන කාණ්ඩ දෙකම ඇතුළත් දේශීය ගුවන්භාණ්ඩ ප්‍රවාහනයට පහසුකම් සැපයීම.
- ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, ශ්‍රීලංකා සංචාරක හා ගුවන්සේවා හා ගුවන්තොටුපළ(ශ්‍රීලංකා) සමාගම ඇතුළත් වෙනත් රාජ්‍ය ආයතන මඟින් සිදුකරන සංචාරක ප්‍රවර්ධන ක්‍රියාකාරකම්වලට සහයෝගයදීම.
- කර්මාන්තයේ විශිෂ්ටයන්ට සම කලහැකි සේවාවන් සැපයීම.
- මෙහෙයුම් සඳහා තිරසරවූ ලෝක ව්‍යාප්ත ගුවන්ගමන් ජාලය ගොඩනැගීම.
- බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ මෙහෙයුම් සිදුකරන ගුවන් සේවාවන්ට භූමි මෙහෙයුම් සැපයීම හා එහි අනුබද්ධ සමාගමක් වන ශ්‍රීලංකන් කේටරින් විසින් ආහාරපාන සැපයීම.
- සේවකයන්ගේ ඵලදායීත්වය වැඩිකිරීම හා සේවා විශිෂ්ටයන් ඇගයීම.
- ගුවන්සේවය ජාත්‍යන්තර පිළිගැනීමට ලක්වී ඇති මිත්‍රශීලීත්වය, රැකවරණ හා ලෙංගතුබව පවත්වාගැනීම හා නිරන්තරයෙන් වැඩිදියුණු කිරීම.

## කාර්යසාධනය 2014

- 2014 ජනවාරි මස 01 වන දින සිට 2014 දෙසැම්බර් මස 30 වන දින දක්වා කාලපරිච්ඡේදය තුල ශ්‍රීලංකන් එයාර්ලයින්ස් මඟින් එහි ගුවන් ගමන් ජාලය හරහා ගුවන් ගමන් වාර 12,979 ක් ක්‍රියාත්මක කරන ලද අතර ගුවන් මගීන් මිලියන 4.24 ක් සඳහා ගුවන්සේවා සපයා ඇත. මෙම කාලපරිච්ඡේදය තුල ශ්‍රීලංකන් ගුවන්සේවය ගුවන් භාණ්ඩ ටොන් 97,563 ක් ප්‍රවාහනය කර ඇත.

- ගුවන්යානා ප්‍රති ඇණිගත කිරීමේ වැඩසටහනට අනුව සමස්තයක් ලෙස පුලුල් බඳ සහිත ගුවන්යානා ප්‍රති ඇණිගත කිරීමට කටයුතු යොදා ඇති අතර එයාර්බස් සමාගමෙන් ඉන්ධන කාර්යක්ෂම සහ නඩත්තු පිරිවැය අවම ගුවන්යානා ලබා ගනු ඇත. පුලුල් බඳ සහිත ගුවන්යානා ප්‍රති ඇණිගත කිරීම යටතේ 2013 ජුනි මස ගුවන් සමාගම එයාර්බස් සමාගමෙන් මිලදීගැනීමේ ගිවිසුම් මත **A330-300** ගුවන්යානා 06 ක් සහ **A350-900** ගුවන්යානා 04 ක් කල්බදු පදනම මත ගුවන් සමාගම විසින් ලබා ගනු ඇත.

- 2014 වසරේ මැයි මස පළමුවෙනිදා වන්වර්ල්ඩ් ගෝලිය සන්ධානය හා එක්වීම තුලින් ගුවන් සන්ධාන පාර්ශවයන් හා එක්ව සමායෝජක කාලසටහන් ඔස්සේ ගෝලිය සම්බන්ධතාවන් ගොඩනැඟීමෙන් විශාල වෙළඳපොලක් බිහිකිරීමේ හැකියාව ඇත. මෙමඟින් ගුවන් මගීන්හට ලෝකයේ වන්වර්ල්ඩ් ගමනාන්ත 1800 ක් දක්වා එක් ගුවන් ප්‍රවේශ පතක් තුලින් ගමන් කිරීමට හැක.

- ගුවන් සමාගම සෞදි අරාබිය ඉලක්ක කර ගනිමින් මැදපෙරදිග වෙත ගුවන් මෙහෙයුම් වැඩි කර ඇත. මෙමඟින් මැදපෙරදිග සහ දකුණු ආසියාව අතර ගුවන්ගමන් ධාරිතාව වර්ධනය කර ගැනීමට අවස්ථාවන් සැලසෙනු ඇත. යුරෝපීය මෙහෙයුම් සඳහා පිරිවැය කාර්යක්ෂම ගුවන්යානා යොදාගැනීම තුලින් ඉල්ලුමට සරිලන ධාරිතාවක් සැපයීමට හැකි වී ඇත. ආසන කිලෝමීටරයක් සඳහා උසස් පැටවුම් ධාරිතාවක් සහ උසස් ආදායම් ලබාගැනීමට මෙයින් ගුවන් සමාගමට හැකිවනු ඇත.

- පාරිභෝගිකයින්ට වැඩි සහනයක් සැපයීම සඳහාම උසස් තත්ත්වයේ ආසන වෙන්කරවා ගැනීමේ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම තුලින් පද්ධති කාර්යක්ෂමතාවය වැඩි කිරීමටත් සේවා සංවර්ධනයක් ඇති කිරීමටත් ලබන වසරවල් තුලදී සමස්ත ප්‍රතිලාභ උත්පාදනය කර ගැනීමටත් හැකිවනු ඇත.

- ශ්‍රීලංකන් ගුවන් සමාගම අතිසාර්ථකව ඕමාන් එයාර් සහ සයිබීරියා එයාර්ලයින්ස් සමඟ සංකේත හුවමාරු ගිවිසුමකට එළඹුන අතර මෙමඟින් ශ්‍රීලංකන් ගුවන්සේවය හරහා කොළඹ වෙත ගුවන් මගීන් ගෙන ඒමට මෙම ගුවන්සේවාවන්ට අවස්ථාව උදා වනු ඇත. ශ්‍රීලංකන් ගුවන් සමාගමේ මගීන් සඳහා ගමනාන්ත රැසකට පහසුකම් සැලසීමට මෙම ගුවන්සේවාවන්ට හැකි වනු ඇත. තවදුරටත් ගුවන් සමාගම වන්වර්ල්ඩ් සාමාජික ගුවන්සේවාවන් 04 ක් සමඟ ලබන මූල්‍ය වර්ෂයේදී සංකේත හුවමාරු ගිවිසුම් වලට එළඹීමට ගුවන් සමාගම කටයුතු යොදා තිබේ.

- මෙහෙයුම් පිරිවැය අවම කරගැනීම සඳහාත් ගුවන් සමාගම ගෝලීය බෙදාහැරීමේ පද්ධතියක් යටතේ කටයුතු කිරීම අවම කිරීමට කටයුතු කර ඇති අතර නව සේවා සමූහ කළමණාකාර පද්ධතියක් හඳුන්වාදීම තුලින් පිරිවැය අවම කර ගැනීමටත් විදේශ සේවා ස්ථාන පිරිවැය අවම කර ගැනීම සඳහාත් ශ්‍රීලංකන්

කාර්යාල සාමාන්‍ය විකුණුම් නියෝජිත කාර්යාල බවට පත්කිරීමත් සම්බන්ධතා ස්ථාන සේවා(සී.පී.එස්) සේවා පිරිවැය අවම කරමින් වැඩිදියුණු කර ගුවන් ගමන් සම්බන්ධතාවයක් ඇති කිරිමට කටයුතු කරනු ඇත.

- ගුවන් සමාගම ශක්තිමත් ආදායම් කළමනාකරණ ක්‍රියාකාරකම් සහ විවිධ ආදායම් වර්ධනය සහ පිරිවැය කළමනාකරණ ක්‍රියාමාර්ග පවත්වා ගැනීමට කටයුතු කරනු ඇත. සමස්ත ගුවන් ගමන් ජාලය උපරිම ලෙස භාවිතා කරමින් මිලකරණ උපාය මාර්ග වෙනස්කම් හඳුන්වා දෙමින් වෙළඳපොල කොටස් සහ තරගකාරීත්වය වෙත අවධානය යොමු කරනු ඇත.

- ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් වෙත නැවත වරක් ගුවන් ගමන් සිදුකිරීමට කටයුතු යොදා ඇති අතර මෙමඟින් පවතින සහ නව ගමන් මාර්ග සඳහා ගුවන්සේවාවේ සමස්ත ගුවන් ගමන් සංඛ්‍යාව උපාය මාර්ගිකව වැඩිකිරීමට බලාපොරොත්තු වේ.

- ශ්‍රීලංකාව සංචාරක ක්ෂේත්‍රය සඳහා සුදුසු ගමනාන්තයක් බවට පත්කිරීමට ගුවන් සමාගම ව්‍යාපාරික සහ විනෝද සංචාර සඳහා ඇති ඉල්ලුම වැඩිකිරීමට ක්‍රියාමාර්ග ගනු ඇත. මෙයින් ප්‍රමුඛ ව්‍යාපාරික සංචාරකයන් ආකර්ෂණය කර ගැනීමටත් එමඟින් ලබන වසරේදී ආදායම වර්ධනය කර ගැනීමටත් ඉලක්ක වී ඇත.

- ශ්‍රීලංකන් ගුවන් සමාගම විසින් මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ගුවන්යානා නඩත්තු හා අලුත්වැඩියා අංශයක් (**MRO**) ස්ථාපිත කිරිමටද කටයුතු යොදා ඇති අතර නවීන පන්නයේ අංශයක් වශයෙන් පටු බඳ සහිත ගුවන්යානා සඳහා නඩත්තු පහසුකම් සැපයීමට කටයුතු යොදා ඇත.

- ජාත්‍යන්තර ගුවන්සේවා ඇකඩමිය වර්තමානයේදී ලෝකයේ තාක්ෂණික නොවන වෘත්තීමය පුහුණුව සඳහා පුහුණු පහසුකම් සැපයීම වෙනුවෙන් **IATA** ප්‍රමුඛ පුහුණු පහසුකම් 10 අතරට පත්විය. මෙම ඇකඩමිය තුලින් අභ්‍යන්තර සේවකයන් 3000 ක් පුහුණු කිරීම සඳහාත් බාහිර සිසුන් වාර්ෂිකව 600 අධික පිරිසක් පුහුණු කිරීම සඳහාත් පහසුකම් සලසා දෙයි. ගුවන් සමාගම විසින් පුහුණු පහසුකම් ලෙස ප්‍රතිරූප උපදේශකත්වය, පෞර්ෂ වර්ධනය සහ ආචාර විධි යනාදී අංශ සඳහාද පුහුණු කිරීම් සිදුකරනු ලැබේ.

# ආදායම් ප්‍රකාශය

2014 අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා

| | අප්‍රේ.-ජූනි.14<br>රු.මි. | අප්‍රේ.-සැප්.14<br>රු.මි. | අප්‍රේ.-දෙසැ.14<br>රු.මි. |
|---|---|---|---|
| ආදායම | 29,371.62 | 64,514.26 | 101,175.03 |
| විකුණුම් පිරිවැය | (34,020.00) | (69,323.67) | (107,708.77) |
| දළ ලාභය/(අලාභය) | (4,648.38) | (4,809.41) | (6,533.74) |
| වෙනත් ආදායම් හා ලැබීම් | 39.69 | 2,212.90 | 2,276.71 |
| විකුණුම් හා අලෙවි පිරිවැය | (3,084.09) | (6,098.53) | (9,265.12) |
| පරිපාලන වියදම් | (472.60) | (1,019.88) | (1,611.37) |
| මූල්‍ය වියදම් | (798.48) | (1,784.96) | (3,052.33) |
| මූල්‍ය ආදායම් | 8.82 | 26.33 | 45.95 |
| මාරු කිරීම් මත ලැබීම්/(අලාභය) | 333.10 | 494.32 | (71.15) |
| **බදු පෙර අලාභය** | (8,622.04) | (10,979.33) | (18,211.15) |
| ආදායම් බදු වියදම් | - | - | - |
| **වර්ෂය සඳහා ලාභය/(අලාභය)** | (8,622.04) | (10,979.33) | (18,211.15) |
| ශ්‍රී ලංකන් කේටරින් ශුද්ධ ආදායම | 395.06 | 936.70 | 1,498.29 |
| අන්තර් සමාගම් ගණුදෙනු | - | (2,122.62) | (2,175.21) |
| **සමූහයේ ශුද්ධ ලාභය/(අලාභය)** | (8,226.98) | (12,165.25) | (18,888.07) |

මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගම

# මිහින් ලංකා පෞද්ගලික සමාගම

## දැක්ම

"කලාපය තුල වඩාත්ම ප්‍රමුඛතම අඩුවැය ගුවන්සේවය බවට පත්වීම"

## මෙහෙවර

"අඛණ්ඩව පැමිණෙන අභියෝගාත්මක තත්ත්වයන් ජයගනිමින් සේවාදායකයන් සඳහා විශ්වාසනීය හා අනර්ඝ සේවාවක් සපයමින් වෙළඳපොල ප්‍රමුඛයා බවට පත්වීම "

## පරමාර්ථය

"අපගේ මගීන් ආරක්ෂාකාරීවත් , සුවපහසු ආකාරයෙනුත්, දරාගත හැකි වැයකිනුත් ඔවුන්ගේ ගමනාන්තයන් වෙත රැගෙනයාම"

<u>හැඳින්වීම</u>

මිහින් ලංකා රජය සතු, අඩුවැය ගුවන්සේවය වන අතර දැනට කොළඹ සහ මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපලවල් ඔස්සේ රටවල් හතක් වෙත ගුවන් ගමන් පවත්වමින් තවදුරටත් ගමනාන්ත වැඩිකර ගැනීමට සැලසුම් කරමින් සිටී. ගුවන්සේවය තම මගී සංඛ්‍යාව වැඩිකර ගැනීම අඛණ්ඩව කරගෙන යනු ලැබේ. ඒ අනුව වාර්ෂිකව ප්‍රවාහනය කරනු ලබන මගී සංඛ්‍යාව පසුගිය මූල්‍ය වර්ෂය තුල 500,000 ඉක්මවා සිටී. ගුවන්යානා ඇණිය එයාර්බස් වර්ගයේ නවීන ගුවන්යානා 03 කින් සමන්විත වන අතර ඉදිරි වසර කිහිපය තුල ගුවන්යානා ඇණිය තවත් වර්ධනය කර ගැනීම ගුවන්සේවයේ අපේක්ෂාවයි.

- දැනට ඉන්දීය උප මහද්වීපයෙන් ඈත පෙරදිග , මැද පෙරදිග සහ අප්‍රිකානු ජාත්‍යන්තර ගමනාන්තයන් 10 ක් වෙත ගුවන් ගමන් පවත්වනු ලැබේ .
- ශ්‍රී ලන්කන් ගුවන් සේවය සමඟ සාමූහිකත්වයක් යටතේ ඔවුන්ගේ ගමනාන්තයන් සඳහා ද මගීන් සඳහා ද තනි ටිකට්පත් නිකුත් කරනු ලැබේ.
- ඉදිරි සිසිර ඍතුව සඳහා සතියකට ගුවන් ගමන් වාර 35 ක් පැවැත්වීමට සැලසුම්කර ඇත.
- පාකිස්තානයේ ලාහෝර් නවතම ගමනාන්තය වෙත ගමන් ආරම්භ කරනු ලැබීය.

## කාර්යසාධනය 2014

සැලකිල්ලට භාජනය වන කාල පරාසය තුල මිහින් ලංකා අඩු ගාස්තු ගුවන්සේවයක් ලෙස කාලපරාසය තුල තවත් ශක්තිමත් කිරීම කරගෙන යනු ලැබේ. ගුවන්සේවය පසුගිය වසරට සාපේක්ෂව තම මූල්‍ය තත්ත්වය සාර්ථක මට්ටමකට ගෙන එමින් ශ්‍රී ලංකාව තුල අඩුවැය ගුවන්සේවා වෙළඳපොලෙහි ප්‍රමුඛයා බවට පත්ව ඇත.

**2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා පසුගිය වසරේ එම කාලයට සාපේක්ෂව ලබාගෙන ඇති ප්‍රගතිය**

සමස්ත ආදායම රුපියල් මිලියන 10,278 දක්වා ඉහලයාම, පසුගිය වසරට සාපෙක්ෂව 10% ඉහලයාමකි.

මෙහෙයුම් ලාභය රුපියල් මිලියන 625 ක් විය. අදාල පසුගිය වසර තුල දළ මෙහෙයුම් පාඩුව රුපියල් මිලියන 1046 කි.

පසුගිය වසරේ ශුද්ධ අලාභය රුපියල් මිලියන 1,713 කි. ගත වූ වසරට වඩා 36% ක වර්ධනයකි.

කෙසේවෙතත් අදාල කාලසීමාව තුල රුපියල් මිලියන 244ක භාණ්ඩාගාර බැදුම්කර මූල්‍ය පරිවර්තනයට පෙර වසරින් වසර 56% වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

නව ව්‍යාපාරික පන්තිය හඳුන්වාදීම එහි ප්‍රතිඵලයක් ලෙස ආදායම් වර්ධනයක් සිදු වූ බව මගීන්ගෙන් ලද ප්‍රතිචාර ඔස්සේ පැහැදිලි විය.

සීෂෙල්ස් වෙත ආරම්භ කරන ලද නව සේවය මාස 06 ක මෙහෙයුම් කාලපරිච්ඡේදය තුල ලාභ උපයන තත්ත්වයට පත්වූයේ මිහින් ලංකා විසින් අරඹන ලද සාර්ථක ගමනාන්තයක් බව තහවුරු කරමිනි. 2014 නොවැම්බර් සිට ඇති වූ ප්‍රගතිය අධ්‍යයනය කරමින් 3 වන ගමන්වාරය ද (සංඛ්‍යාතය) සීෂෙල්ස් වෙත ක්‍රියාත්මක කිරීම මිහින් ලංකා සහ ශ්‍රීලංකන් ගුවන්සේවා දෙකටම ඵලදායී වී ඇත.

## මිහින් ලංකා උපායමාර්ග

**ජාලය ව්‍යාප්ත කිරීම මඟින් පුළුල් මගී ආදායමක්**

අපගේ සිත්ගන්නා සුළු ආදායම් කළමනාකරණය සමඟ ජාත්‍යන්තර මට්ටමේ සේවා තත්ත්වයන් හඳුන්වාදීම මඟින් මගීන් ආකර්ෂණය කොට ආදායම් වර්ධනය කර ගැනීම.

**නව සහයෝගී ආදායම් මාර්ග හඳුන්වාදීම මඟින් සේවාවට වැඩි වටිනාකමක් එක්කිරීම**

වර්ධනය වන ආදායම අඩුවැය ගුවන්සේවාවකට සුවිශේෂී තත්ත්වයකි. පවතින උප බද්ධ සේවාවන් හරහා වඩාත් හොඳ තත්ත්වයක් අත්කර ගැනීම පිණිස නව ක්‍රම භාවිතා කිරීම. පරිසනක ඍජු මාර්ග ඔස්සේ ගුවන් ටිකට්පත් මිලදී ගැනීමට හා කල් ඇතිව ආසන වෙන්කරවා ගැනීමට ඇති හැකියාව තුලින් මෙන් ම අතිරේක ආහාරපාන සහ වැඩිපුර ගමන් මලු බර අනුමත කිරීම තුලින් ද අමතර ආදායම් ලැබීම.

**කාර්යක්ෂමතාව වර්ධනය හා නඩත්තු වැය පාලනය**

සේවා කාර්යක්ෂමතාවය ඔස්සේ තවදුරටත් කාර්යක්ෂමතා මට්ටම පවත්වා ගැනීම.
ඉන්ධන දහනය කළමනාකරණය තුලින් ඉන්ධන කාර්යක්ෂමතාව පවත්වා ගැනීම. අන්තර්ජාල වෙන්කිරීම ප්‍රවර්ධනය තුලින් වැය පාලනය ඉංජිනේරු සේවාවන් හි කාර්යශීලීත්වය වර්ධනය කොට වඩා ක්‍රියාශීලී තාක්ෂණික සේවා අත්කර ගැනීම.

**ශ්‍රී ලංකන් ගුවන් සමාගම සමඟ සමීප සම්බන්ධතාවයක් පවත්වා ගැනීම**

ශ්‍රීලංකන් සමඟ පවතින සම්බන්ධතාව වඩාත් ශක්තිමත් කරගනිමින් දෙපාර්ශවයම ඵලදායී ලෙස පාලනය කිරීම. එකිනෙක පාර්ශවයේ අවශ්‍යතා හඳුනාගෙන සාමූහිකව කටයුතු කිරීම තුලින් ශ්‍රී ලංකාව කලාපයේ ගුවන් කේන්ද්‍රය බවට පත්කිරීමේ අභිලාශය සාක්ෂාත් කර ගැනීමට දිරි දීම.

## සමස්ත කාර්යසාධන සාරාංශය

| | ජන: -දෙසැ: | | |
|---|---|---|---|
| රු. මි. | 2014 | 2013 | % |
| **ශුද්ධ ආදායම** | **10,278** | **9,342** | **10%** |
| **සෘජු මෙහෙයුම්** | **(7,394)** | **(7,823)** | **-5%** |
| **ගුවන්යානා සඳහා වැය** | **(2,231)** | **(2,566)** | **-13%** |
| **මෙහෙයුම් ලාභය/ (පාඩුව)** | **652** | **(1,046)** | |
| ස්ථාවර අතිරික්ත | (1,912) | (1,358) | 41% |
| **මූල්‍ය ගාස්තු** | **(453)** | **(291)** | **56%** |
| ශුද්ධ ලාභය/ (පාඩුව) | (1,713) | (2,695) | - **36%** |

***ජාල කාර්යසාධනය***

| | ජන: -දෙසැ: | | |
|---|---|---|---|
| | 2014 | 2013 | % |
| මාර්ග සංඛ්‍යාව | 11 | 12 | 9% |
| සංඛ්‍යාත ගණන | 1,715 | 1,635 | 5% |
| මගීන් | 481,601 | 505,259 | -5% |
| බර සාධකය | 76% | 75% | 1% |
| ප්‍රතිලාභය RPK*(YRPK) -USC | 5.50 | 4.91 | 12% |
| වියදම ASK* (CASK) – USC | 4.81 | 4.59 | 5% |
| ආදායම ASK (RASK) - USC | 4.27 | 3.87 | 10% |

**මූලාශය –අභ්‍යන්තර සංඛ්‍යාලේඛන – මිහින් ලංකා (පෞද්) සමාගම**

ගුවන්සේවයේ මගී දර්ශකය 1% කින් සහ කිලෝ මීටර් 1 ට මගී ආදායම 12% කින් වර්ධනය වී ඇත.

මෙය පසුගිය වසරට සාපේක්ෂව ඒකක ආදායම 10% ක වැඩි වීමකි. එමෙන් ම එකී කාලය සඳහා ඒකක වැය ඉහල ගොස් ඇත්තේ 5% කිනි. මෙමඟින් අලාභයේ අඩුවීමක් සිදු වී ඇත.

# නාවික හා ගුවන්සේවා තොරතුරු හා පර්යේෂණ (පුද්ගලික) සමාගම

## දර්ශනය

"නාවික හා ගුවන්සේවා ක්ෂේත්‍ර වෙත වඩාත් කාර්යක්ෂම

හා

ඵලදායී සේවාවක් සැපයීම"

## මෙහෙවර

"නාවික හා ගුවන් සේවා පිළිබඳ තොරතුරු රැස් කිරීම,

පර්යේෂණ කිරීම හා පුහුණුව සැපයීම මෙම ක්ෂේත්‍රවල
අනාගත දියුණුව හා අභිවෘද්ධිය සැලසීම"

<u>අරමුණු</u>

- නාවික හා ගුවන් සේවා ක්ෂේත්‍ර වලට අදාල අමාත්‍යවරයා විසින් නියම කරන අවස්ථාවන්හිදී වරාය හා ගුවන් මඟින් සිදු කරන ආනයන අපනයන සම්බන්ධයෙන් දත්ත හා තොරතුරු රැස් කිරීම හා අවශ්‍ය පාර්ශව වෙත ලබා දීම.

- නාවික හා ගුවන් සේවා ක්ෂේත්‍ර වලට අදාල අමාත්‍යවරයා විසින් නියම කරන අවස්ථාවන්හිදී වරාය හා ගුවන් මඟින් සිදු කරන භාණ්ඩ ප්‍රවාහනය සම්බන්ධයෙන් දත්ත හා තොරතුරු රැස් කිරීම හා අවශ්‍ය පාර්ශව වෙත ලබා දීම හා එවැනි කටයුතු ප්‍රවර්ධනය සඳහා පවරනු ලබන කාර්යයන් ඉටු කිරීම.

- ලාභ ලැබීමේ පදනම මත, වරාය හා ගුවන් මඟින් සිදු කරන ආනයන අපනයන පිළිබඳ දත්ත හා තොරතුරු රැස් කිරීම හා බෙදා හැරීම.

- ලාභ ලැබීමේ පදනම මත, නාවික, වරාය හා ගුවන්සේවා ක්ෂේත්‍ර පිළිබඳ පර්යේෂණ සිදු කිරීම හා භාර ගැනීම.

- ආනයන අපනයන හා සම්බන්ධ ක්ෂේත්‍ර සඳහා පුහුණු අධ්‍යාපනය ලබා දීම හා මඟපෙන්වීම.

- නාවික හා ගුවන්සේවා ක්ෂේත්‍ර වල ප්‍රවර්ධනයට අදාල පුහුණු වැඩ සටහන්, දේශන, වැඩමුළු, සම්මන්ත්‍රණ හා මානව සම්පත් සංවර්ධන වැඩ සටහන් පැවැත්වීම හා සම්බන්ධීකරණය කිරීම.

- රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතන වල ශාස්ත්‍රීය, වාණිජ්‍ය, වාණිජ්‍ය නොවන හෝ විද්‍යාත්මක ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු හා දත්ත රැස් කිරීම හා බෙදා හැරීම.

- රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතන වල වෙනත් ඕනෑම ක්ෂේත්‍රයක එනම් කෘෂිකාර්මික, අධ්‍යාපනික, මූල්‍ය සේවා, ඉංජිනේරු සේවා, රක්ෂණය හෝ රාජ්‍ය හෝ රාජ්‍ය නොවන හෝ සුභසාධන ක්‍රියාකාරකම් පිළිබඳ පර්යේෂණ සිදු කිරීම හා ශක්‍යතා අධ්‍යයනයන් සිදු කිරීම.

# කාර්යසාධනය 2014

**පර්යේෂණය/ ව්‍යාපෘතිය**

**ජේ. ආර්. ජයවර්ධන කේන්ද්‍රය සඳහා සංයුක්ත සැලැස්ම 2014/2017 (Corporate Plan) සකස් කිරීම**

ජනාධිපති ලේකම් කර්යාලය යටතේ පවතින ආයතනයක් වන ජේ. ආර්. ජයවර්ධන කේන්ද්‍රය සඳහා 2014/2017 වර්ෂ සඳහා සංයුක්ත සැලැස්ම (Corporate Plan) සකස් කිරීම අප ආයතනය විසින් සිදු කරන ලදී.

**පර්යේෂණය/ ව්‍යාපෘතිය**

**අන්තරායකර රසායනික ද්‍රව්‍ය හැසිරවීම සම්බන්ධ වැඩමුළු පැවැත්වීම**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ඉල්ලීමක් පරිදි අන්තරායකර රසායන ද්‍රව්‍ය හැසිරවීම පිළිබඳ දෙදින වැඩමුළුවක් පැවැත්වූ අතර ආචාර්ය රොහාන් පෙරේරා මහතා විසින් හය මෙහෙයවන ලදී.

**නාවික හා ගුවන්සේවා තොරතුරු සහ පර්යේෂණ (පුද්) සමාගම**

**2014 ජනවාරි 01 දින සිට 2014 දෙසැම්බැර් 31 දක්වා වූ ආදායම් වියදම් වාර්තාව**

රුපියල්

| **මුදල් ලැබීම්** | | **එකතුව** |
|---|---|---|
| ස්ථාවර තැන්පත් පොළී (ලංකා බැංකුව) | 2,167,064.38 | |
| **ව්‍යාපෘති මඟින් ලැබූ ලාභය** | 225,225.00 | |
| **මුළු ලැබීම්** | | **2,392,289.38** |
| **මුදල් ගෙවීම්** | | |
| සභාපති දීමනා | 712,869.57 | |
| කළමණාකාරීත්ව දීමනා | 246,000.00 | |
| සේවක වේතන/දීමනා | 1,175,398.22 | |
| අධ්‍යක්ෂ මණ්ඩල දීමනා | 509,000.00 | |
| සේවක අර්ථසාධක/සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල | 255,491.14 | |
| ගොඩනැගිලි කුලී | 342,000.00 | |
| වාහන දීමනා | 260,000.00 | |
| සන්නිවේදන වියදම් | 72,814.57 | |
| කාර්යාල හා කාර්යාලීය උපකරණ අළුත්වැඩියා සහ නඩත්තු වියදම් | 86,107.35 | |
| සුළු මුදල් ප්‍රතිපූර්ණය | 63,858.16 | |
| මුද්‍රණ/ලිපිද්‍රව්‍ය හා තැපැල් වියදම් | 45,666.40 | |
| මූල්‍ය වියදම් (බැංකු අයිරා පොළී) | 263,512.38 | |
| ගමන් වියදම් | 2,500.00 | |
| විගණන ගාස්තු | 15,000.00 | |
| **මුළු ගෙවීම්** | | **4,050,217.79** |
| ශුද්ධ අතිරික්තය/(හිඟය) | | (1,657,928.41) |

**මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන -නාවික හා ගුවන්සේවා තොරතුරු සහ පර්යේෂණ (පුද්) සමාගම**